# ශ්‍රී ලංකාවේ ප්‍රවෘත්ති වෙබ් අඩවි හා දේශපාලන මහජන මතය

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

***ඩබ්ලිව්. එම්. අයි. ලක්මාලි*** [1]

---

**සංක්ෂේපය**

ජනමතය යනු කිසියම් පිරිසක් එක්තරා තොරතුරක් අරභයා පොදු මතයකට පැමිණීම ලෙස සරලව දැක්විය හැකිය. වර්තමානය වන විට විවිධ විෂය ක්ෂේත්‍රයන් ඔස්සේ ජන මතයන් ගොඩනැගෙන අතර, දේශපාලන විෂය ක්ෂේත්‍රය තුළ දේශපාලන සිදුවීමක් පිළිබඳ ජනතාව දරන මතය "දේශපාලන ජනමතයයි" යනුවෙන් හඳුනා ගනිමු. මෙම දේශපාලන ජනමතය ගොඩ නැගීම සඳහා වර්තමානය වන විට විවිධ උපාය මාර්ගයන් භාවිත කෙරෙන අතර අන්තර්ජාල ප්‍රවෘත්ති වෙබ් අඩවි ද ඒ අතර වේ. ශ්‍රී ලංකාවේ ප්‍රවෘත්ති වෙබ් අඩවි ජනතාවගේ දේශපාලන මතය සකස් කිරීම සඳහා බලපෑම් කරන්නේද, යන්න පිළිබඳ අධ්‍යයනය කිරීම මෙමගින් සිදු විය. එහි දී ප්‍රමාණාත්මක හා ගුණාත්මක ක්‍රමවේදයන් ඔස්සේ දත්ත රැස් කරන්නට විය. පුවත්පත් වෙබ් අඩවිවල අන්තර්ගත පුවත් පිළිබඳව වැඩි දුරටත් අධ්‍යයනය කරමින් ප්‍රමාණාත්මක දත්ත ලබා ගැනීම සඳහා අන්තර්ගත විශ්ලේෂණයක් සිදු කරනු ලැබීය. එහි දී ලොව පිළිගත් තොරතුරු වර්ගීකරණය වන ඇලෙක්සා ආයතනයේ වර්ග කිරීමට අනුව ශ්‍රී ලංකාව තුළ වඩාත් ජනප්‍රිය මෙන් ම, අවම ජනප්‍රියත්වයක් පවතින පුවත් වෙබ් අඩවි (2015-08-16 වන දිනට අනුව) වන ගොසිප් ලංකා නිවුස්, ලංකා සී නිවුස්, ලංකා ඊ නිවුස් , යන පුවත් වෙබ් අඩවි මෙම අන්තර්ගත විශ්ලේෂණයට උපයෝගී කරගන්නට විය. ප්‍රවෘත්ති ග්‍රහණය කර ගන්නා ඡන්ද දායකයා වෙත ප්‍රශ්නාවලියක් ලබා දෙමින් ග්‍රහණය කරගන්නා පුවත් ඔස්සේ ඔවුන්ගේ මතයට යම් බලපෑමක් සිදු වන්නේ ද යන්න පිළිබඳ විමසා බලන්නට විය. ශ්‍රී ලංකාවේ ප්‍රවෘත්ති වෙබ් අඩවිවල අන්තර්ගත ප්‍රවෘත්ති, ජනතාවගේ දේශපාලන මතය ගොඩනැගීම සඳහා බලපෑම් නොකරයි යන්න මෙහිදී නිගමනය කළ හැකි විය. දේශපාලන මහජන මතය සකස් කිරීමේ දී ප්‍රබල ජනමාධ්‍ය ආයතනයක් ලෙස අන්තර්ජාල ප්‍රවෘත්ති වෙබ් අඩවි ග්‍රාහක ප්‍රතිපෝෂණය උදෙසා ප්‍රබලවම භාවිතා කළ යුතුය යන්න මෙහි දී යෝජනා කළ හැකිය.

**ප්‍රමුඛ පද : ජනමතය, අන්තර්ජාල ප්‍රවෘත්ති වෙබ් අඩවි, ප්‍රවෘත්ති , දේශපාලනය**

---

[1] ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය